# පෙරට ඇදෙන ඌරාපොල

* යසසිරි ජනක කුමාර

දෙපස මඩ විසි කරමින් ගෙදර බලා තරඟ යට දුවන කොලු පැංචන්. භූමිතෙල් බෝත්ලය එක් අතකින්, අනික් අතින් ගවුම් පොඩ්යත් අල්ලාගෙන නියර දිගේ ගෙදර යන කෙලි පොඩිත්තියන්. සෙරෙප්පු දෙක අතින් අරන් හිමින් සීරුවේ ගෙදර යන වැඩි මහල්ලන්. වැසි දිනක ගොම්මන් වෙලාවේ යටිනුවර ඌරාපොල ගමට ඇදෙන්නකු නෙත ගැටෙනුයේ මෙවැනි දර්ශනයකි.

අදද මේ සියල්ල එලෙසින්ම සිදුවේ. එහෙත් කඩිනමිනි. ඌරාපොල ඉතිහාසයේ එම හෙමින් පිටුව අවසානවරට පෙරලුනේ මීට පස් වසරකට පමණ පෙරය. පසුගියද අපද ඉලුක්වත්ත හන්දියේ සිට ඌරාපොලට පා නැඟුවේ එම නියර දිගේමය. එහෙත් කඩිනමිනි. එද ගමේ පන්සලට යා හැකි මහ වූ එම නියර අද අඩි පාරකි. අඩි දෙකක් පළලට සිමෙන්ති ඇතුරූ එය ශ්‍රී අභයාරාම මාවතය.

## ගමයි - පන්සලයි

එම අඩි පාරේ ගමේ පන්සලට ගිය අපටද, සිංහල ජාතියේ පදනම වන ගැමි සංස්කෘතිය රකිමින්, ගමක් නව ග්‍රාම සංවර්ධන සැළසුම් යටතේ දියුණුව කරා පා නගන අයුරු දක ගත හැකි විය.

යටිනුවර ප්‍රාදේශීය උප දිසාපති වසම තුළ පිහිටා ඇති ඌරාපොල ගමේ ආර්ථිකය කෘෂි කර්මය මත පදනම් වූවකි. වර්ග ප්‍රමාණය අක්කර 150 කි. ගොඩැලි හා කුඹුරු මින් වැඩි ප්‍රමාණයක් අත් කරගෙන ඇත. ගැමි පවුල් 350 ක් පමණ වන අතර සාමාන්‍ය ජනගහණය 1,200 ක් තරම් වේ. නිසල වටාපිටාවක් ඇති නිහඬ ගම්මානයක් වුවද, ගමෙහි සංවර්ධන කටයුතුවලදී ගම්මුන් කඩිනමින් එකමුතුව කටයුතු කරන අයුරු ගමේ පන්සලේ දී අපට මැනවින් දක ගැනීමට ලැබුණි.

ගමයි-පන්සලයි යන අප ඉපැරණි පදනම යටතේ ගමේ පන්සල වන ශ්‍රී අභයාරාමය කේන්ද්‍ර කරගෙන, ඌරාපොල ශ්‍රී අභයරාජ ග්‍රාම සංවර්ධන සමිතිය පිහිටුවා ඇත. ගමේ කටයුතු ගම් මට්ටමින් සැළසුම් කිරීමේ නව ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව ඌරාපොල ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් 1972 දී මුල් සංවර්ධන සැළැස්ම සකස් කර ඇත. ගමක මූලික අවශ්‍යතාවයන් වන පාරවල්, ළිං, සෞඛ්‍ය සේවා හා වගා කටයුතුවලට මුල් තැන දෙමින් සකස් වූ මෙම සැළැස්ම ක්‍රියාත්මක කිරීමෙලා ගම්මුන් එකමුතුව ඉදිරිපත්ව ඇත.


## ශ්‍රමදන

"අපේ වැඩ අපිම කර ගන්න ඕනනේ"යි ශ්‍රී අභයරාම විහාරාධිපති හා සංගමයේ සභාපති කොටබෝගොඩ රතනසාර හිමියෝ මෙම සැළැස්ම ගැන විස්තරයක් කරමින් පැවසූහ. "අපේ ගම්මුන්ගේ එක්සත්කම අපිට ධෛර්යයක් වුනා. එය පුදුම වෙන්න දෙයක් නෙවෙයි. ගමක වැඩට කවුරුත් එකතු වෙන එක ගමේ ගතියක්නේ. වැඩි සද්ද බද්ද නැතිව අපි ශ්‍රමදන මගින් මේ කටයුතු පුළුවන් හැටියට කළා. මුදල් වැඩි වශයෙන් යෙදෙන කටයුතුවලදී ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව අපිට උදව් කළා."

"ඉලුක්වත්ත හන්දියේ සිට පන්සලට යන මුලින් සඳහන් අභයාරාම මාවත මේ අනුව සකස් වූ පාරකි. වැහිදට එරී එරී තමයි එන්න වුනේ. පස්සේ අපි නියර ටිකක් පළල් කර කලුගල් හා සිමෙන්ති දමා හද ගත්තා. දැන් කොච්චර වැස්සත් ප්‍රශ්නයක්

---

* ප්‍රවෘත්ති ප්‍රකාශන නිළධාරි



කුඹුරුයාය මැදින් වැටී ඇති නව අඩි පාරක්

නෑ.'' සමිති සාමාජික ධර්මදස මහතා කීය. ශ්‍රමදාන මගින් කරන ලද කටයුතුවල වටිනා කම රු. 1,500 ක් පමණ වන අතර ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව රු. 1,998 ක් වැය කර ඇත. මේ අයුරින්ම ගොනන්දෙනිය වත්ත-කුරුඳු වත්ත මාවත සකස් කර ඇති අතර, එම ශ්‍රමදාන කටයුතුවල අගය රු. 6,000/- ක් පමණව ඇත. හැතැප්මක් පමණ දිග මෙම මාවත ලැලි පාලමකින්ද සමන්විතය.

ඌරාපොල හරහා දිවෙන ප්‍රධාන පාරක් නොමැත. ''වාහනයක් ගමට ගේන්න බැහැ. අපේ පාරවල් කුඹුරු ගොඩැලි මැද්දෙන් යන අඩි පාරවල්. ඒවා සියල්ලම මේ වගේ පහසුවෙන් යන්න එන්න පුළුවන් විදිහට හදා ගත්තා. මේ කාලේම වාගේ බටහිර ජර්මනියේ කොන්රඩ් ඇඩිනෝර් ජාත්‍යන්තර සම්බන්ධතා ආයතනය අපිට සෑහෙන ආධාර යක් කළා. වීල්බැරෝ, උදළු, අලවංගු, කතුරු වාගේ දේ අපිට ලැබුණා. මේවා අපේ ශ්‍රමදාන කටයුතුවලදී හුඟාක් ප්‍රයෝජන වත් වුනා.''. රතනසාර හිමියෝ තවත් කරුණු දක්වමින් පැවසූහ.

කිඩාරම මාවත් සංවර්ධන ක්‍රමය යටතේ ඌරාපොල ගම්මුන්ගේ මූලිකම අවශ්‍යතා වයක් දූන් ඉටුවෙමින් පවතී. ගම හරහා දිවෙන ඌරාපොල ප්‍රධාන පාරේ කටයුතු මේ වසර තුළ අවසන් කිරීමට බලාපොරොත්තු වේ. අවුරුදු පහලොවක පමණ කාලයක සිට ගම්මුන් විසින් සකස් කරන මෙම පාර මෙවර කෙසේ හෝ නිම කිරීම ඔවුන්ගේ අධිෂ්ඨානයව ඇත. වරින්වර පාර කැපුවද නොයෙකුත් අපහසුකම් නිසා එය වල් බිහිව ඇත. නානුඔය හරහා ඉදිවන පාලමේ කට යුතුද දැන් කඩිනම්ව ඇත. මහාමාර්ග දෙපාර්ත මේන්තුව මෙය ඉදි කරන අතර වියදම රු. 85,000/- කි. ඌරාපොල වැසියන් මෙහිලා දිගු කලක් සිට ගත් උනන්දුව නිසාම විමධ්‍ය ගත අයවැයෙන් පාලම සඳහා මුදල් වෙන් කර ගැනීමට හැකි වී ඇත. නව පාලමත් සමඟම මෙම පාර කොළඹ-නුවර පාරට සම්බන්ධ වනු ඇත.

පොදු ප්‍රයෝජනය සඳහා ගම්මුන් විසින්ම තෝරා ගත් ස්ථාන එකොළහක ළිං බැඳීමද

සංවර්ධන සැළැස්මට අනුව සිදුවේ. මීන් ළිං තුනක් පමණ ඉදි කර ඇත. ශ්‍රමදාන මගින් මෙම ළිං භාරා ඇති අතර, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රු. 750/- බැගින් වෙන් කර දී ඇත.

වෙනත් ගම්වල තරමට මෙහි වැසිකිළි ප්‍රශ්නයක් නොවන නමුදු, අවශ්‍ය අය සඳහා වැසිකිළි ගල් සමිතිය මූලික වී ලබා දී ඇත.

ඌරාපොල සාමාන්‍ය පවුලක් සතු ඉඩම් ප්‍රමාණය අක්කර කාලක් හෝ බාගයක් තරම් වේ. වැඩි වශයෙන් කෙරෙනුයේ මිශ්‍ර වගා වන්ය. එළවළු, මිරිස්, කරාබු, සාදික්කා මීත් මුල්තැන්ගනී. සමිතිය මගින් එළවළු ඇට නොමිලයේ බෙදා දී, හැම ගෙවත්තෙහිම කිසිවක් වගා කරවීමට ගම්මුන් උනන්දු කරවා ඇත. මිරිස් පැල තවානක් සකස් කර මිරිස් පැලද, අන්‍යෝන්‍ය සහයෝගීතාවය යටතේ අවට ගම් වලින් කරාබු පැලද ගම්මුන්ට ලබා දී තිබේ. ජර්මන් ආධාර යටතේ ලබා ගත් තෙල් ඉසින යන්ත්‍රයක්ද ගම්මුන්ට නොමිලයේ ප්‍රයෝජන ගැනීමට සලසා දී ඇත.

ශ්‍රමදාන හා සෙසු පොදු වැඩවලදී තරුණ තරුණියන් මෙන්ම වැඩිහිටියන්ද එකසේ පෙරට ඒම විශේෂයක් බව අප හා ඌරා පොල සවාරියට එක් වූ සාමාජික මහතුන්ගේ අදහසය. වැඩිහිටි උපදෙස් හා උදව් ඇතිව මේ සියල්ල කෙරෙන බවත් මේවා තමන් සඳහාම කෙරෙන්නක් බවත් සියල්ලන්ම වටහාගෙන තිබීම මෙහි සාර්ථකත්වයේ රහස බවද ඔව්හු පෙන්වා දුන්හ.

## පුස්තකාලය

ශ්‍රී අභයාරාම දහම් පාසැල හා ශ්‍රී සීලරතන පුස්තකාලය ඌරාපොල සංවර්ධනයේ ලා මූලික වන තවත් සංවිධාන දෙකකි. දරු දැරියන් 150 ක් පමණ, හැම ඉරිදවකම පැවැත්වෙන දහම් පාසැලට පැමිණෙන අතර, ඔවුන් විනයශීලී ආගමානුකූල පිරිසක් ලෙසින් හැඩගැස්වීමේ ලා ඉන් ලැබෙන ඉගෙනුම මහත් පිටුවහලක්ව ඇති බව ජ්‍යෙෂ්ඨනායක හා ආතාවුද යන වැඩිහිටි සාමාජික මහත්වරු පැවසූහ. ගමේ සෙසු සුභසාධක කටයුතු සඳහා මධ්‍යස්ථානයව ඇත්තේද දහම් පාසැලය. ජර්මන් ආධාර උපයෝගි කර ගනිමින්, ඊට අවශ්‍ය මේස පුටු හා බංකු සකස් කරගෙන ඇත. මේවා සෙසු සමිතිවල හා පුස්තකාල කටයුතු සඳහාද ප්‍රයෝජනයට ගනු ලැබේ.

පොත් සියයකින් පමණ 1972 දී ආරම්භ කළ පුස්තකාලයේ දැන් පොත් 500 ක් පමණ ඇත. ආරම්භක සාමාජික සංඛ්‍යාව 47 ක් වුවද, දැන් එය සෑම පවුලක්ම වාගේ නියෝජනය වන පරිදි ව්‍යාප්තව ඇත. ග්‍රාමීය මට්ටමේ පුස්තකාල පැවැත්වීමෙන් මෙරට පොත් කියවීමේ පුරුද්ද වැඩි කළ හැකි අයුරු පෙන්වන සාර්ථක ආදර්ශයකි ඌරාපොල පුස්තකාලය.

## නව ව්‍යාපාර

විශාඛා ළදරු පාසැලද ග්‍රාම සංවර්ධන සමිතිය යටතේ පැවැත්වෙන්නකි. රුපියල් දෙසියක පමණ මූලික වියදමක් දරා 1972 දී ආරම්භ කරන ලද මෙම ළදරු පාසැලින් පාසැල් නොයන දරු දැරියන් 25 කට පමණ අධ්‍යාපනය ලබා දෙනු ලැබේ.

රැකියා නොමැති තරුණ-තරුණියන්ට ආදායමක් ලබා දෙනු වස් ගමෙහි ඇන්තූරියම් වගාවක් සමිතිය මගින් ආරම්භ කර ඇත. මේ සඳහා තෝරා ගත් සාමාජිකයින් දහ දෙනෙකු අතර රු. 1,000/- ක් බෙදා දී ඇත. ඔවුන් ආදායමක් ලබනවිට කොටස් මුදල් ලෙස අපහසුවක් නොවන පරිදි මෙම මුදල ආපසු සමිතියට ලැබෙන අතර ඒවා මල් වගාව තවත් ව්‍යාප්ත කරවීමට යොදා ගනු ලැබේ.

ඌරාපොල කථාව සාර්ථකත්වයෙන්ම පිරුණක් නොවේ. පරාජයේ අම්හිරද ඌරා පොල වැසියන් දරාගෙන ඇත. සාර්ථකත්වයේ කේන්ද්‍රස්ථානය වන අභයාරාමයේම පසෙක පරාජයේ සළකුණු අඳද වේ. අත් කඩදාසි ව්‍යාපාරය මෙම අසාර්ථක ව්‍යාපාරයය. සුළු කර්මාන්ත ග්‍රාම සංවර්ධනයට යොදා ගැනීමේ පියවර යටතේ 1972 මෙම කඩදාසි



මැහුම් ගෙතුම් පුහුණුව ලබන තරුණියන්

ව්‍යාපාරය ආරම්භ කරන ලදී. තරුණයන් හය දෙනෙකු කොත්මලේ කඩදසි ආයතනයට යවා අභ්‍යාසමය පුහුණුවක් ලබා දී එම ව්‍යාපාරය ආරම්භ කරන ලදී. පිදුරු අමු ද්‍රව්‍යය විය. මෙම ක්‍රමය යටතේ කඩදසි නිපදවුවද, වෙළඳපලක් හා සෙසු කඩදසි හා තරඟ කළ හැකි නිමාවක් ලබා ගැනීම උගහට වීම නිසා ව්‍යාපාරය අත්හැරීමට සිදුවිය. රු. 2,000 ක් පමණ වැය කර ගත් උපකරණ අද කාමරයක අගුළු ලා ඇත. පොදු ප්‍රතිපත්තියක් යටතේ මෙම ක්‍රමය පණ ගන්වන්නේ නම් මිස ඌරාපොල වැනි කුඩා ඒකකයට එයට පණක් දිය නොහැක. ක්‍රියාකාරී පොදු පිළිවෙතක් යළි ඇති වන්නේ නම් කඩදසි ව්‍යාපාරයේ යළි නිරත වීමට තරුණයින් සූදානම්ය.

තරුණයන් මේ අභාග්‍යයට මුහුණ දුන්නද, තරුණියන් සාර්ථකව ඉදිරියට ඇදෙන අයුරු ග්‍රාමීය කාන්තා මැහුම් හා අත්කම් මධ්‍යස්ථානයේදී අපට දැනගත හැකි විය. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එක් අවුරුදු කාලයක් සඳහා පවත්වන මෙම මධ්‍යස්ථානයේ දැනට තරුණියන් 25 ක් පමණ පුහුණුව ලබති. ඇඳුම් කැපීම, මැසීම, ගෘහ විද්‍යාව, අත්කම් හා ගෙවතු වගාව පිළිබඳව ඔවුනට මෙහිදී අධ්‍යයනයක් ලැබේ. ඉතා ඉහළ නිමාවකින් යුත් ළමා හා කාන්තා ඇඳුම්, දැල් මලු, එළවළු මලු මෙහි නිෂ්පාදනය කෙරේ. සාමාන්‍ය මාසික නිෂ්පාදනවල වටිනාකම රු. 800/- ක් පමණ වේ. රෙදි හා අමු ද්‍රව්‍ය මෙම තරුණියන් විසින්ම යොදගන්නා හෙයින් නිෂ්පාදන අලෙවි මුදල් ඔවුන්ටම දෙනු ලැබේ. මෙම මධ්‍යස්ථානය ඉතා සාර්ථකව පැවතෙන්නක් බව මෙම තරුණියන් ඉන් තමන් ලබන පුහුණුව හා ආදායම විස්තර කරමින් කීහ.

ගම්වැසියන් මුහුණපාන ඉඩම් හා ජල ප්‍රශ්ණ විසඳා වගා කටයුතු නංවාලීම අරමුණු කරගත් 1976–1978 තුන් අවුරුදු සැළැස්ම දැන් ක්‍රියාත්මක වේ. සෙසු සමාජයීය ප්‍රශ්නද මින් විසඳෙන හෙයින් මෙය සාර්ථක කර ගැනීමට තමන් උනන්දු වන බව රතනසාර හිමි හා අනෙකුත් සාමාජික මහත්වරු අප සමඟ අවසාන වශයෙන් පැවසූහ.

පන්සල සංවර්ධන කටයුතුවලට මුල් වීමත්, දේශපාලන හා සෙසු වාද භේද වලින් තොරව ජනතාව ඒ වටා ඒකරාශි වීමත් මෙම සමිතියේ දියුණුවට හේතු වී ඇති බව අප හා ඌරාපොල සවාරියේ යෙදුණ ග්‍රාම සංවර්ධන පරිපාලක ඒකනායක හා නිලධාරී ධනපාල යන මහත්වරු පැවසූහ. සැළැස්ම හා නායකත්වය ගමෙන් ම ලැබීම ඌරාපොල සාර්ථකත්වයට හේතු වන අතර පරිපාලනමය වශයෙන්ද එය සෙසු ගම්වලට කදිම ආදර්ශයක් බව මෙම කටයුතු සම්බන්ධීකරණය කරන යටිනුවර උප දිසාපති ආතාවුද මහතා පැවසුවේ මහත් සොම්නසිනි.